සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

**නම/විභාග අංකය :- ..........................................................** **කාලය: පැය 02 යි.**

I කොටස

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න.

❖ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) කිසියම් අවස්ථාවකට ගැළපෙන පරිදි යොදා ගන්නා පැරණි කියමන් හඳුන්වන්නේ,

1) යුගල පද ලෙසයි.  2) විශේෂණ පද ලෙසයි.

3) ප්‍රස්තාව පිරුළු ලෙසයි.  4) ජනප්‍රවාද ලෙසයි.

02) 'ගඟට ඉනි කැපුවා වගේ ' යන පිරුළට ගැළපෙන අදහස වන්නේ,

1) කපටි ක්‍රියාවක් බවයි.  2) අපරික්ෂාකාරී ක්‍රියාවක් බවයි.

3) පාඩුවක් සිදු වූ බවයි.  4) අසාර්ථක ක්‍රියාවක් බවයි.

03) 'ඉහේ මලක් පිපුණි' යන රූඪී පදයෙහි අර්ථය දෙන අදහස තෝරන්න.

1) උත්සවයකට සැරසෙන බවයි.  2) බලාපොරොත්තු ඉටු වූ බවයි.

3) සිතේ ඇති වූ සතුටයි.  4) ඔළුවේ මලක් ගසා ඇති බවයි.

❖ **හිස්තැනට වඩාත් සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න**

04) ........................ වේලාසනින් ම පුස්තකාලයට ගියෙමි.

1) ඇය  2) අපි  3) මම  4) ඔහු

05) ........................ අම්බලමේ ගිමන් හැරියෝ ය.

1) මගීහු  2) මගීන්  3) මගියා  4) මගියා විසින්

06) ගුරුතුමිය ගීයක් ........................................

1) ගැයුවේ ය.  2)ගැයුවා ය.  3) ගැයූහ.  4) ගැයුවෙමු.

❖ අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

07) 1) විශේෂණ  2) විශේසණ  3) විශේශන  4) විශේෂන

08) 1) ඖෂධ  2) ඖෂද  3) ඖෂද  4) ඖෂධ

09) 1) ඍජුකෝනය  2) රිජුකෝණය  3) ඍජුකෝණය  4)ඍජුබෝනය



LIVEWORKSHEETS

❖ ප්‍රශ්න අංක 10 සිට 12 දක්වා ප්‍රශ්නවල පද තුනක් අර්ථයෙන් සමානය. සමානාර්ථයක් නොදෙන පදය තෝරන්න.

10) 1) හිරු 2) දිනකර 3) සොමි 4) දිනමිණ

11) 1) ගස 2) ලිය 3) රුක 4) වෘක්ෂය

12) 1) ප්‍රාසාදය 2) මන්දිරය 3) පිළිමය 4) මැදුර

❖ සිංහල අක්ෂර මාලාව ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

13) නූතන සිංහල වර්ණ මාලාවේ <u>සඤ්ඤක</u> අක්ෂර ගණන කීයද?

1) 10 යි. 2) 5 යි. 3) 18 යි. 4) 3 යි.

14) සිංහල වර්ණ මාලාවේ <u>ව්‍යඤ්ජන</u> අක්ෂර ගණන වන්නේ,

1) 54 2) 60 3) 42 4) 52

15) <u>මහප්‍රාණ</u> අක්ෂරයක් යෙදී නැති වචනය තෝරන්න.

1) ආශ්චර්යය 2) අනුරාධපුරය 3) සෞඛ්‍යය 4) විභීෂණ

16) <u>ස්වරයකින්</u> ආරම්භ වී ඇති වචන තෝරන්න.

1) සම්මන්ත්‍රණය 2) ගොවියා 3) චන්ද්‍රයා 4) ඒදණ්ඩ

17) 'මග දිගට ජනකතා' කෘතිය මහනුවර ප්‍රදේශයේ ප්‍රචලිත පුරාවෘත්ත හා බැඳුණු ජන කතා සංග්‍රහයකි. එය රචනා කළේ කවුද?

1) කුමාරතුංග මුනිදාස 2) මාර්ටින් වික්‍රමසිංහ

3) ඩී. පී . වික්‍රමසිංහ 4) කේ. ජයතිලක

18) නූතන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රකට ලේඛකයෙකු වන කේ. ජයතිලක මහතාගේ ස්වයං චරිතාපදානය වන්නේ, 1) නොනිමි සිත්තම 2) පුංචිරාළ

3) පුංචි පැළේ ගස වෙනා 4) චරිත තුනක්

19) "පයිං ඇවිදිල්ලා මහන්සි ද මන්දා" මෙම ප්‍රකාශය ඇතුළත් වේදිකා නාට්‍යය කුමක් ද?

1) කුවේණි 2) සිංහබාහු

3) තොප්පි වෙළෙන්දා 4) නරිබෑනා

20) දත් කැකුළු පාලා

සුරතල් සිනා සීලා

බොළඳ බස් දීලා

කෙළී සියොලඟ දූලි ගාලා

මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

1) ගුත්තිල කාව්‍ය 2) සිරිත් මල් දම 3) කාව්‍යශේඛරය 4) සුභාෂිතය

( ලකුණු 2 x 20 = 40 )



LIVEWORKSHEETS